(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 1(4).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2009 ජූලි මස 24 වැනි සිකුරාදා**

## 2009 අගෝස්තු මස 06 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0267/'09

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඛනිජ ද්‍රව්‍ය අපනයනකරුවන් සඳහා 2009 පෙබරවාරි මස 03 වැනි දින ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලයේ දී වැඩසටහනක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, එහි අරමුණු කවරේද;

(iii) එහිදී සාකච්ඡා කළ කරුණු කවරේද;

(iv) එම සාකච්ඡාවට පැමිණි පුද්ගලයින්ගේ නම් කවරේද;

(v) අදාළ සාකච්ඡාව සඳහා මුදල් ලබාදුන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0082/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) බස් ගාස්තු වැඩිකිරීමෙන් 2008 වර්ෂයේ ශ්‍රී ලංගමයේ ආදායම රුපියල් දශලක්ෂ 17,150 ක් දක්වා වැඩි කරගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එය ශ්‍රී ලංගමයේ පෙර වර්ෂයේ ආදායමට වඩා සියයට 16.8 කින් වැඩි කර ගැනීමක් බවත්;

(ii) බස් ගාස්තු වැඩි කිරීම නිසා ආදායම වැඩි වී තිබියදීත්, 2008 වර්ෂයේ දී ශ්‍රී ලංගමයේ මෙහෙයුම් අලාභය රුපියල් දශලක්ෂ 3554 දක්වා ඉහළ ගොස් ඇති බවත්;

(iii) මෙම අලාභය පෙර වසරට වඩා සියයට 53.8 කින් වැඩිවීමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත අධික අලාභය ලැබීමට හේතු කවරේද;

(ii) විෂය භාර අමාත්‍යතුමා ලෙස මේ තත්ත්වය වෙනස් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0083/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008 වර්ෂයේ දී දුම්රිය ගාස්තු ඉහළ දැමීම නිසා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ආදායම රුපියල් දශ ලක්ෂ 3,671 දක්වා සියයට 22.4 කින් වැඩි කර ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එහෙත්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය රුපියල් දශ ලක්ෂ 4,553 දක්වා සියයට 5.9 කින් 2008 වර්ෂයේදී ඉහළ ගොස් ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දුම්රිය ගාස්තු වැඩි කිරීම නිසා ආදායම වැඩිවී තිබියදීත් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අලාභය වැඩි වීමට හේතු කවරේද;

(ii) විෂයභාර අමාත්‍යතුමා ලෙස මේ තත්ත්වය වෙනස් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0058/'09

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ පිහිටා ඇති මධ්‍යම රජයේ හෝ පළාත් සභාවල පාලනය යටතේ පවතින මුලු ඉඩම් ප්‍රමාණය කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශිකයන්ට (එම පුද්ගලයන් අයත් වන රට නම් කරන්න), සමාගම්වලට සහ තනි පුද්ගලයන්ට ලබා දුන් ඉඩම් කවරේද;

(ii) එම ඉඩම් ලබා දීමට අදාළ නියමයන් සහ කොන්දේසි, ඒවායේ වටිනාකම සහ ඒවා ලබා දෙන කාල සීමාව කවරේද;

යන්න උතුරු සහ නැගෙනහිර පළාත්වලට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) දැනට පෞද්ගලික අංශය වෙත පැවරීමට, විකිණීමට හෝ බදු දීමට කටයුතු කෙරෙමින් තිබෙන රජයට අයත්ව තිබූ ආයතනවල නම් සහ ඒ සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි කවරේද;

(ii) ඒවා ලබා දීමට නියමිතව ඇත්තේ කවර කාල සීමාවන් සඳහා ද;

(iii) එම කොන්ත්‍රාත්වල වටිනාකම කොපමණ ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0063/'09

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගුවන් යානා සහ නැව්වලට ශ්‍රී ලංකාවේ ලියාපදිංචිවීමට 2008.01.01 දින සිට ක්‍රියාත්මක වූ අය-වැය ලේඛනයෙන් සහන සලසා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දින දක්වා ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සහන සැළසීමෙන් අනතුරුව එලෙස ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහන සැළසීම නිසා අහිමිවූ ආදායම් ප්‍රමාණය කොපමණද;

(iv) එලෙස වෙනත් රටක පහසුකම් මත ලියාපදිංචිවීමේ සහනය ලබාදීම තුළින් අප ලබාගත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සහන ලබාදීමෙන් අනතුරුව ලියාපදිංචි කරන ලද නැව් සහ ගුවන්යානා හිමිකරුවන්ගේ සහ කොටස්කරුවන්ගේ නම් කවරේද;

(ii) මෙහිදී ලබාගත් ප්‍රගතියේ මට්ටමට වඩා වැඩියෙන් පුද්ගලයන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවූයේ මන්ද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0402/'09

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ පවත්නා කාර්මික ජනපද සංඛ්‍යාව හා ඒ කවරේද;

(ii) එක් එක් කාර්මික ජනපදය තුළ ඇති කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂය ආරම්භ වන විට ක්‍රියාත්මකව තිබූ මේ වන විට සම්පූර්ණයෙන් වසා දමන ලද කර්මාන්ත ශාලා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) 2009 වර්ෂය ආරම්භ වන විට ක්‍රියාත්මක වූ මේ වන විට සේවකයින් ඉවත් කරන ලද කර්මාන්ත ශාලා තිබේද;

(iv) එසේ නම්, ඒ කවරේද;

(v) වසා දමන ලද කර්මාන්ත ශාලා හිමිකරුවන්ට රජය මගින් යම් සහනයක් ලබා දී තිබේද;

(vi) ඉවත් කරන ලද සේවකයින් සඳහා ලබාදුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

### (2009 අගෝස්තු මස 06 වැනි බ්‍රහස්පතින්දා)

0381/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනා කර ඇති පරිදි "ජන සෙවන" වැඩ සටහන් යටතේ සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදි කෙරෙනු ඇති බවට සඳහන් වන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) සමස්ථයක් ලෙස රට තුළ ඉදිකර ඇති නව නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර දිස්ත්‍රික්කවල කවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් ගම්මාන තුළද;

(iii) මෙම වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ඉදිකර තිබෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරි වසම් කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ මහ නගර සභා බල ප්‍රදේශයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0434/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0436/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0437/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0438/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0439/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 අගෝස්තු මස 18 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0003/'09

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටේ ක්‍රියාත්මකව පවතින රූපවාහිනී මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) බලපත්‍ර නිකුත් කර ඇතත්, මෙහෙයුම් ආරම්භ කර නොමැති රූපවාහිනී මධ්‍යස්ථාන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම රූපවාහිනී මධ්‍යස්ථානවල විකාශය කිරීමේ සංඛ්‍යාතය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දේශීය චිත්‍රපට කර්මාන්තයට සහාය ලබාදෙන චේතනාවෙන් රට තුළට විදේශ රූපවාහිනී චිත්‍රපට ගලා ඒම අධෛර්යමත් කරනු සඳහා රජය විසින් බදු හඳුන්වා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එමගින් අපේක්ෂිත අභිමතාර්ථය සැපිරී තිබේද;

(ii) එසේ නම්, මෙවැනි ප්‍රතිලාභ ලබාගෙන ඇති ස්ථාන සහ ආකාර කවරේද;

(iii) බද්ද පැනවූ දින පටන් අද දක්වා එක් එක් රූපවාහිනී මධ්‍යස්ථානය විසින් මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) (i) මෙම රූපවාහිනී මධ්‍යස්ථානවලට පනවා ඇති අනෙකුත් බදු කවරේද;

(ii) රජය විසින් ඉකුත් මාස 12ක කාලය තුළ උපයාගත් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ස්වාධීන රූපවාහිනිය මගින් 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීමෙන් ඒ ඒ දේශපාලන පක්ෂවලින් ආයතන හා පුද්ගලයින්ගෙන් එක් එක් වර්ෂයේදී ඉහත ආයතනය උපයාගෙන ඇති මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පූර්ව මැතිවරණ කටයුතුවල යෙදීම හේතුවෙන් අයකර ගැනීමට ඇති මුදල කොපමණද;

(ii) ඒ කවර පක්ෂයකින්, කවර ආයතනයකින් සහ කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0186/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා ධීවර සංස්ථාව 2000 වර්ෂයේ සිට මේ දක්වා ලබා තිබෙන ලාභය හෝ පාඩුව කොපමණද;

(ii) පාඩුවක් ලබා තිබේනම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාඩුව ලාභයක් බවට පත් කිරීම සඳහා මේ වන විට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0187/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "මිහින් ලංකා" ගුවන් සේවය සඳහා 2008, 2009 වර්ෂවල අයවැයෙන් වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම ගුවන් සේවයට අමතරව රජයට අනුබද්ධ තවත් ගුවන් සේවයක් තිබේද;

(iii) එසේ නම්, එහි නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිහින් ලංකා ගුවන් සේවය සතු ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානාවල ලියාපදිංචි අංකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂය තුළ මිහින් ලංකා ගුවන් සේවය ලැබූ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0192/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉන්දීය ධීවරයින් අප රටට අයත් මුහුදු තීරයේ මසුන් අල්ලන බව එතුමා දන්නෙහිද?

(ආ) අප රටට අයත් මුහුදු තීරයේ මසුන් ඇල්ලීමට ඉන්දීය ධීවරයින්ට අයිතියක් නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම මසුන් ඇල්ලීම නතර කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0268/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රී රෝද රථ රියදුරන් සඳහා පෙට්‍රල් සහනාධාරයක් ලබාදීමට රජය තීරණයක් ගත් බවත්;

(ii) ඒ සඳහා චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්;

(iii) එම චක්‍රලේඛයට අනුව සහනාධාරය ලබා ගැනීමට ඉදිරිපත් වූ සංඛ්‍යාව ඉතා අවම බවත්;

(iv) එයට හේතුව සහනාධාරය ඉල්ලුම් කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහා අයදුම් කිරීම සංකීර්ණ කිරීම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ මෙතෙක් පෙට්‍රල් සහනාධාරය ඉල්ලුම් කළ සංඛ්‍යාව කොපමණද;

(ii) සහනාධාරය ලබාගත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0067/'09

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්තමානයේදී රජයේ රූපවාහිනී ප්‍රචාරණ ආයතන සහ පෞද්ගලික සමාගම්වලට රූපවාහිනී ප්‍රචාරණය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (ශ්‍රී. ල. රූ. ස.) පනත යටතේ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවද දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නියාමනය වී ක්‍රියාත්මක වන්නක් වන බැවින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම අනෙක් බලපත්‍රලාභීන්ට හා අයදුම්කරුවන්ට අසාධාරණයක් වන අතර සාධාරණ වෙළඳාම හා සම අවස්ථා සැලකීමේදී ලෝක වෙළඳ සංවිධානය (W.T.O.) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග අත්සන් කරන ලද ගිවිසුම් උල්ලංඝණය කිරීමක්ද වන බව ගරු අමාත්‍යතුමා දන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්තමානයේදී රූපවාහිනී ප්‍රචාරක බලපත්‍ර නිකුත් කිරීමට යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ අදාළ විධිවිධාන අවලංගු කර එම විධිවිධාන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ හෝ ඒ හා සමාන පනතක් යටතේ යලි හඳුන්වා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0105/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජාතික රූපවාහිනිය 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනය එම පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතු මගින් එක් ඒක් දේශපාලන පක්ෂයෙන් හෝ ආයතන හා පුද්ගලයින්ගෙන් වාර්ෂිකව උපයාගත් මුදල කොපමණද;

(ii) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීම හේතුවෙන් කොපමණ මුදලක් අය කරගැනීමට තිබේද;

(iii) එසේ අයකර ගතයුතුව ඇත්තේ කවර පක්ෂයකින්, කවර ආයතනයකින්, කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

0385/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකා විදුලිබල මණ්ඩලය මුහුණදී ඇති උග්‍ර මූල්‍ය අර්බුදයට විසඳුමක් වශයෙන් "ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ්" හි ලංකා විදුලිබල මණ්ඩලයට අයත් 63%ක කොටස් විකිණීමට රජය තීරණය කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම කොටස් විකිණීමේ දී විවෘත ටෙන්ඩරයකින් කොටස් විකිණීමට පියවර ගෙන තිබේද;

(ii) මේ ආකාරයට පෞද්ගලික අංශයට කොටස් විකිණීම "මහින්ද චින්තනයට" පටහැනි නොවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

### (2009 අගෝස්තු මස 18 වැනි අඟහරුවාදා)

0066/'09

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ එක් එක් මැතිවරණ කොට්ඨාසයේ හෝ මැතිවරණ බල ප්‍රදේශයේ ලියාපදිංචි ඡන්දදායකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත එක් එක් මැතිවරණ කොට්ඨාසයේ,

(i) මුලු ජනගහනය;

(ii) ස්ත්‍රී, පුරුෂ සංයුතිය;

(iii) වයස් කාණ්ඩ අනුව විභේදනය; හා

(iv) ආගමික විභේදනය හා ජාතීන් අනුව විභේදනය;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 අගෝස්තු මස 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0193/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009 අයවැයෙන් ධීවර ක්ෂේත්‍රය සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිරිදිය ධීවර කර්මාන්තය සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද;

(ii) ඉස්සන් වගාව සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) "මිහින් ලංකා" ගුවන් සේවයට 2009 අයවැයෙන් මිලියන හය දහසක් වෙන්කර තිබෙන තත්ත්වයක් තුළ, ධීවර ක්ෂේත්‍රයට වෙන්කර තිබෙන මුදල ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0207/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 අයවැයෙන් ධීවර ජනතාවට සහන ලබා දී තිබේද;

(ii) එම සහන කවරේද;

(iii) එම සහන ක්‍රියාත්මක වන්නේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0208/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ කොපමණ වැව් හා ජලාශ ප්‍රමාණයක මත්ස්‍ය වගා කටයුතු ආරම්භකර තිබේද;

(ii) ඒ කවර වැව් හා ජලාශවලද;

(iii) ඒවායේ වගා කළ මසුන් වර්ග කවරේද;

(iv) එම වැව් හා ජලාශවල මත්ස්‍ය වගාවේ නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0068/'09

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්තමානයේදී රජයේ ගුවන් විදුලි විකාශන ආයතන සහ පුද්ගලික සමාගම්වලට ගුවන් විදුලි විකාශනය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවද දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නියාමනය වී ක්‍රියාත්මක වන්නක් වන බැවින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම අනෙක් බලපත්‍රලාභීන්ට හා අයදුම්කරුවන්ට අසාධාරණයක් වන අතර සාධාරණ වෙළඳාම හා සම අවස්ථා සැලකීමේදී ලෝක වෙළඳ සංවිධානය (W.T.O.) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග අත්සන් කරන ලද ගිවිසුම් උල්ලංඝණය කිරීමක්ද වන බව ගරු අමාත්‍යතුමා දන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්තමානයේදී ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමට යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ අදාළ විධිවිධාන අවලංගු කර එම විධිවිධාන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ හෝ ඒ හා සමාන පනතක් යටතේ යලි හඳුන්වා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0070/'09

ගරු රවි කරුණානායක මහතා,—ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ දෙක තුළ මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද සියලුම රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර පිළිබඳ විස්තර එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම බලපත්‍ර නිකුත් කරන ලද්දේ ටෙන්ඩර් පදනමකින්ද;

(ii) ඒ සඳහා අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කිරීම මගින් උපයා ගනු ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0256/'09

ගරු අජිත් කුමාර මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක රජයේ පාසල්, පිරිවෙන් හා පෞද්ගලික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් ඒවා නම් වශයෙන් කවරේද;

(iii) ඉහත රජයේ පාසල් හා පිරිවෙන් සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව හා දැනට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ රජයේ පාසල් හා පිරිවෙන් අතුරින් මේ වන විට වසා දමා ඇති සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් හා පිරිවෙන් වසා දමන ලද්දේ කවර වර්ෂවලදී ද;

(iii) ඒවා එලෙස වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් හා පිරිවෙන් වසා දැමීමෙන් වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේනම් එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0266/'09

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයට මාසික කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර කාර්යයක් සඳහාද;

(iii) ඒ ඒ ගොඩනැගිලි සඳහා ගෙවන මාසික කුලිය වෙන වෙනම කොපමණද;

(iv) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(v) එම ගොඩනැගිලි ලබා ගන්නේ කවර ආකාරයටද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) දෙහිවල, ගාලුපාර, අංක 04 දරන ලිපිනයෙහි පිහිටා ඇති ගොඩනැගිල්ල කවර ආයතනය සඳහා මිලදී ගෙන තිබේද;

(ii) ඒ කවර වර්ෂයේ සිටද;

(iii) එහි මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0263/'09

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය මගින් "ගජ මිතුරෝ" නමැති ව්‍යාපෘතියක් ආරම්භකර තිබේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(iii) විදුලි වැටවල් ඉදිකිරීම සඳහා "ගජ මිතුරෝ" ව්‍යාපෘතිය කොපමණ මුදලක් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය මගින් ආරම්භ කර ඇති වෙනත් ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) වෙන් වෙන් වශයෙන් ඒවා කවරේද;

(iii) දැනට අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවා කවරේද;

(iv) සාර්ථකවී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවා කවරේද;

(v) මෙම ව්‍යාපෘති සඳහා වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0264/'09

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2000 වසරේ සිට ආරම්භ කර ඇති විදුලි වැට ඉදිකිරීමේ ව්‍යාපෘති පිළිබඳ විස්තරයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට "ගජ මිතුරෝ" ව්‍යාපෘතිය බාර නොදුන්නේ කවර හේතු නිසාද;

(ii) "ගජ මිතුරෝ" ව්‍යාපෘතිය තුළ අලි ඇතුන්ගේ ආහාර, ජලය, ලවණ ආදී අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, ඉහත අවශ්‍යතාවයන් සඳහා කුඩා වැව් ඉදිකිරීම අදාළ ව්‍යාපෘතිය මගින් හඳුනාගෙන තිබේද;

(iv) ඒ සඳහා වෙන් කළ මුදල හා මෙතෙක් ඉදිකර ඇති කුඩා වැව් සංඛ්‍යාව පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0378/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නෙදර්ලන්ත රජය විසින් ශ්‍රී ලංකාවට ලබාදෙන සියලු ආධාර සම්පූර්ණයෙන්ම නවතා ඇති බවට නෙදර්ලන්ත පාර්ලිමේන්තුව තුළ, එරට රජය වෙනුවෙන් අමාත්‍යවරයෙකු ප්‍රකාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ආධාර නවතා දැමීමට හේතුව, ශ්‍රී ලංකාව තුළ සිදුවන උග්‍ර මානව හිමිකම් උල්ලංඝණය වීම, සිවිල් ජනතාවගේ මරණ සහ නීතියේ උත්තරීතරභාවය පළුදු කිරීම බවට එම ප්‍රකාශයේ සඳහන් වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නෙදර්ලන්ත රාජ්‍යය සමග නැවත යහපත් සම්බන්ධතා ගොඩනඟා ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 අගෝස්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0071/'09

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් පසුගිය වර්ෂ 02 තුළ නිකුත් කරන ලද සියලුම ගුවන් විදුලි සංඛ්‍යාත (සංඛ්‍යාත පරාසය) පිළිබඳ විස්තර එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගුවන් විදුලි සංඛ්‍යාත (සංඛ්‍යාත පරාසය) නිකුත් කරන ලද්දේ රාජ්‍ය දේපළ නිකුත් කිරීම සඳහා නියම කොට ඇති රජයේ ටෙන්ඩර් පටිපාටිවලට අනුකූලවද;

(ii) එක් එක් ගුවන් විදුලි සංඛ්‍යාතය (සංඛ්‍යාත පරාසය) ප්‍රදානය කිරීමෙන් උපයා ගත් ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0073/'09

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1948 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා සහ 2000 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වාත්, වෙන් වෙන් වශයෙන් 2006, 2007, 2008 හා 2009 වර්ෂවලත් පාර්ලිමේන්තුව විසින් නියම කරන ලද උපරිම ණය ගැනීමේ සීමාවන් කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත දක්වන ලද කාලපරිච්ඡේදයන්හිදී දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ණයට ගනු ලැබූ මුදල් ප්‍රමාණයන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2005 සිට 2009 දක්වා කාලය තුළ අතිරේක වියදම් පියවා ගනු පිණිස උපයා ගනු ලැබූ රජයේ ආදායමද වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0074/'09

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2000 සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) දළ ජාතික නිෂ්පාදිතය සහ වර්ධන වේගය කොපමණද;

(ii) මුළු ණය සහ ඒක පුද්ගල ණය කොපමණද;

(iii) ශ්‍රම බලකාය සහ උද්ධමන අගයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0218/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 ජනවාරි මාසය තුළදී ඉන්දීය විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණියේද;

(ii) එසේනම්, ඒ කවර දිනයකදී ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉන්දීය විදේශ අමාත්‍යවරයා එසේ පැමිණියේ ශ්‍රී ලංකා රජයේ ආරාධනයක් අනුවද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉන්දීය විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණ සාකච්ඡා පැවැත්වූ පාර්ශ්වයන් හා ඔවුන්ගේ නම් කවරේද;

(ii) ඒ කවර දිනවලදී ද;

(iii) ඉන්දීය විදේශ අමාත්‍යවරයා සාකච්ඡා කළ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0219/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට ගෙන්වා තිබෙන දුම්රිය මැදිරි හා භෝජනාගාර රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි හා භෝජනාගාර රථ මෙරටට ගෙන්වූ දිනයන් සහ මෙතෙක් භාවිතයට නොගෙන තිබෙන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ මූල්‍ය වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0182/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මිහින් එයාර් ගුවන් සමාගම පිහිටවනු ලැබුවේ කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිහින් එයාර් ගුවන් සමාගමේ සභාපතිවරයාගේ නම, ලිපිනය සහ ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සභාපතිවරයා එම තනතුරට පත්කරනු ලැබුවේ කවරෙකු විසින්ද;

(ii) ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0382/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රජය/ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය අවුරුදු 2 තුළ පෞද්ගලික බැංකුවලින් ණය මුදල් ලබාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ණය මුදල් ලබාගත් බැංකු හා ලබාගත් ණය මුදල කොපමණද;

(ii) එම ණය මුදල් සහ අදාළ පොළිය ගෙවිය යුතු කාලසීමාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මුදල් පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට බැවින් ඉහත පෞද්ගලික බැංකුවලින් එම ණය මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එසේ නොවන්නේනම්, ඉහත ණය ලබාගැනීම තුළින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0282/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජපන් විදේශ ආර්ථික සේවා අරමුදල මගින් රු. 256,914,765/- ක් වැය කර දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ලෙස ආරම්භ කරන ලද අඹේපුස්ස - ගල්වල ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිත වීම නිසා 2007 වර්ෂයේ දින 253 ක් නිෂ්පාදන කටයුතු නතරවී තිබූ බවත්;

(ii) ඒ අනුව, 2007 වර්ෂයේ නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගෙන ඇත්තේ 34% ක ප්‍රමාණයක් බවත්;

(iii) එම නිසා රු. 33,808,358/- ක් වටිනා ගල් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීමට කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වයන් යටතේ ද අදාළ ව්‍යාපෘතිය මගින් 2007 වර්ෂයේ අතිකාල හා ගමන් වියදම් ලෙස රු. 4,457,356/- ක් ගෙවා ඇති බවත්;

(ii) ඒ අනුව, නිෂ්පාදන ධාරිතාවය හා අතිකාල ගෙවීම් පිළිබඳව පරස්පරයක් ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0283/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, පුද්ගලික කටයුතු සඳහා නිල වාහන පාවිච්චි කිරීමට හිමිකම් නැති දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 16 දෙනෙකු, 2007 වාර්තාවලට අනුව වාහන පාවිච්චි කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන් කවුරුන්ද;

(ii) පාවිච්චි කරන වාහන සහ අදාළ ලියාපදිංචි අංක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0178/'09

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අපේ රටේ පවත්නා ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් වෙන් වෙන් වශයෙන් අයත්වන්නේ පළාත් සභාවලටද නොඑසේ නම්, මධ්‍යම රජයට ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් දිස්ත්‍රික්කය අනුව අදාළ පාසල්වල නාමලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙම "ක්‍රීඩා පාසල්" සංවර්ධනය සඳහා විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් කවර හෝ අමාත්‍යාංශයක් මගින් ක්‍රියාත්මක කරන එවැනි ව්‍යාපෘතියක් තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ක්‍රීඩා පාසල් කවරේද;

(v) අදාළ පාසල් තෝරාගැනීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 අගෝස්තු මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0189/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008 ඔක්තෝබර් මාසයේ සිට මේ දක්වා විදේශ ධීවර යාත්‍රා මගින් මෙරට වරායන් හරහා ගොඩබාන ලද තුන්වන කාණ්ඩයේ මාළු ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ ධීවර යාත්‍රා මගින් ගොඩබාන ලද තුන්වන කාණ්ඩයේ මාළුවලින් කොපමණ ප්‍රමාණයක් ධීවර සංස්ථාව විසින් මිල දී ගනු ලැබුවේද;

(ii) එහි වටිනාකම කොපමණද;

(iii) විදේශ ධීවර යාත්‍රාවලින් එසේ මිල දී ගත් මාළු කිලෝග්‍රෑම් එකක මිල කොපමණද;

(iv) එම මාළු කිලෝග්‍රෑම් එකක් අලෙවි කළ මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0222/'09

ගරු පේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකා බැංකුවේ කොළඹ තැපෙ‍්‍රා්බේන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන භාණ්ඩාගාර ගිණුම් බැංකු අයිරාව 2005 දෙසැම්බර් මස 31 දිනට, 2008 දෙසැම්බර් මස 31 දිනට සහ 2009 ජනවාරි මස 30 දිනට වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බැංකු අයිරාව මෙතරම් ඉහළ ගොස් ඇත්තේ කවර හේතු නිසාද;

(ii) බැංකු අයිරාව ඉහළ යාම වළක්වා ගැනීමට මේ වන විට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0060/'09

ගරු රවි කරුණානායක මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සුනාමිය හේතුවෙන් මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) සුනාමිය හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින් සංඛ්‍යාව සහ විනාශ වූ නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයට අදාළව කොපමණද;

(iii) රජය විසින් යලි ඉදි කොට ජනතාවට ලබා දුන් නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) දේශීය හෝ විදේශීය රාජ්‍ය නොවන ආයතන විසින් යලි ඉදි කර දෙන ලද නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයට අදාළව කොපමණද;

(v) සුනාමිය නමැති විශේෂිත කාරණය හේතුවෙන් රටක් වශයෙන් අප ලද ප්‍රදාන සහ ආධාර ප්‍රමාණය 2005 ජනවාරි 01 වැනි දින සිට මේ දක්වා එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0080/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රත්මලාන පැරණි ආහාර ගබඩා ඉඩමේ ගොඩනැගිල්ල තුළ පිහිටුවන ලද ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එම වැය කළ මුදල ඒ ඒ අංශ යටතේ වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැරණි ආහාර ගබඩා ගොඩනැගිල්ල සඳහා අලුතෙන් එකතු කළ අංශ කවරේද;

(ii) පැරණි ගොඩනැගිල්ලේ කොටස් ඉවත් කරන ලද්දේ ද;

(iii) එසේ ඉවත් කළේ නම්, යකඩ ඇතුළු අනෙක් කොටස්වලට සිදු වූ දෙය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0081/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පන්තියේ තනතුරු වලට බඳවා ගැනීම 2004/2005 යනුවෙන් තරඟ විභාගයක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, ඒ කවර දිනකද;

(iii) පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) පැවති පුරප්පාඩු සංඛ්‍යාව හා පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) බඳවාගනු ලැබූ අවම ලකුණු ප්‍රමාණය කොපමණද;

(vi) බඳවාගෙන ඉතිරි වූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පත්වීම් භාර නොගත් හා සේවය අත්හැරයන්නන්ගෙන් ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා දෙවන වටයට අපේක්ෂකයන් කැඳවීමට පියවර නොගැනීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0085/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ස්වාධීන රූපවාහිනී ආයතනය (අයි. ටී. එන්) මගින් විකාශනය කරන "තුලාව" දේශපාලන වැඩ සටහන වර්ෂ 2007 සිට 2009 අප්‍රේල් මස 30 වැනි දින දක්වා කාලය තුළ විකාශනය කළ සම්පූර්ණ වාර ගණන කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී වැඩසටහන් සාකච්ඡා සඳහා උක්ත කාලය තුළ සහභාගි කරගෙන ඇති සම්පූර්ණ දේශපාලන නියෝජිතයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නිලධාරි මට්ටමේ නියෝජනය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) අනෙකුත් ක්ෂේත්‍ර නියෝජනය කරමින් සහභාගි වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ කාලය තුළ දේශපාලන පක්ෂ අනුව සහභාගී වී ඇති දේශපාලන නියෝජිතයින් සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩිම වාර ගණනක් සහභාගී වී ඇති අයගේ පිළිවෙළින්, පුද්ගලයින් අනුව වැඩසටහන් නියෝජනය කළ වාර ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0289/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් පිඹුරු අංක 11 දරන උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්වත්ත - කටුදෙණිය වත්ත නමැති ඉඩම කේ. ඩී. සෙනවිරත්න නමැති අයට තක්සේරු මුදලකට අනුව නීත්‍යානුකූලව පවරා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සෙනවිරත්න මහතාට අයත් මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය සඳහා ලබා දී තිබූ බිම් කොටසේ ප්‍රාදේශීය සභාව මගින් ජල ටැංකියක් ඉදිකර ඇති බවත්;

(ii) එම නිසා එම මාර්ගය පරිහරණය කිරීමේ ගැටළු පැන නැඟී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) කොමිෂන් සභාව සතුව පවතින දැනට ප්‍රජා ශාලාව හා සෞඛ්‍ය මධ්‍යස්ථානය අතර ඇති බිම් කොටස සෙනවිරත්න මහතාට විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කිරීමට ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0442/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005 සිට 2009 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල මැතිවරණ කොට්ඨාසය තුළ සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ලැබූ මුදල් ප්‍රමාණය අනුව ඉහත පවුල් අයත්වන කණ්ඩායම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධිලාභීන් අතර දිළිඳුකම අවම වීමක් සිදුවී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 අගෝස්තු මස 21 වැනි සිකුරාදා)

0443/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005 සිට 2009 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට මැතිවරණ කොට්ඨාසය තුළ සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ලැබූ මුදල් ප්‍රමාණය අනුව ඉහත පවුල් අයත්වන කණ්ඩායම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධිලාභීන් අතර දිළිඳුකම අවම වීමක් සිදුවී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0444/’09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005 සිට 2009 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දිනට මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළ සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ලැබූ මුදල් ප්‍රමාණය අනුව ඉහත පවුල් අයත්වන කණ්ඩායම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධිලාභීන් අතර දිළිඳුකම අවම වීමක් සිදුවී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?